**ජාතික ශිල්ප සභාව - 2018**
**-------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

ජාතික ශිල්ප සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-------------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**--------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

### 1.4 විගණන විෂය පථය

---------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

----------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

----------------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01<br><br>ප්‍රමිතයේ 106 වන වගන්තිය ප්‍රකාරව අයභාර සහ වියදම් අයිතම ප්‍රමාණාත්මක වන විට ඒවායේ ස්වභාවය හා ප්‍රමාණය වෙන වෙනම හෙළිදරව් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අයභාර ලෙස ගිණුම්ගත කළ එකතු වටිනාකම | අමාත්‍යාංශ ප්‍රතිපාදන මත ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබූ අතර, මුළු වටිනාකම ප්‍රමාණාත්මක වුවද, මෙය එක් වැඩසටහනකි. ඒ අනුව එක් වියදම් ශීර්ෂයක් යටතේ ගිණුම්ගත කරන ලදී | ගිණුම් ප්‍රමිතය ප්‍රකාරව වියදම් අයිතම ප්‍රමාණාත්මක වන විට ඒවායේ ස්වභාවය හා ප්‍රමාණය වෙන් වෙන්ව හෙළිදරව් කළ යුතුය. |

| | | |
|---|---|---|
| රු.25,144,662 ක් සහ වියදම් ලෙස ගිණුම්ගත කළ එකතු වටිනාකම රු.25,182,061 ක් සටහන් කිරීමේදී ඒවායේ ස්වභාවය හා ප්‍රමාණය වෙන් වෙන්ව හෙළිදරව් කර නොතිබුණි. | | |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07<br><br>2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 05 - තොග අගය කිරීම යටතේ දේපළ, පිරියත හා උපකරණ පවරා ගැනීම සහ කඩා ඉවත් කිරීම සම්බන්ධව තොරතුරු හෙළිදරව් කර තිබූ නමුත්, එය තොග ප්‍රමිතයෙන් ආවරණය නොවන අතර, දේපළ, පිරියත හා උපකරණ ප්‍රමිතය යටතේ හෙළිදරව් කර නොතිබුණි. | 2019 අවසාන ගිණුම තුළින් හෙළිදරව් කිරීමට කටයුතු කරනු ඇත. | දේපළ පිරියත හා උපකරණ ප්‍රමිතය යටතේ හෙළිදරව් කළ යුතුය |
| (ඇ) 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ රු.21,297,645 ක තොග වටිනාකමක් දක්වා තිබූ නමුත්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 09 ඡේද අංක 47(අ) ප්‍රකාරව භාවිතා කළ පිරිවැය සූත්‍රයද ඇතුළුව තොග මැනීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය සම්බන්ධව ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල සිදු කර නොතිබුණි. | 2019 වර්ෂයේදී හෙළිදරව් කිරීමට කටයුතු කරමි. | යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය සම්බන්ධව ප්‍රමාණවත්ව හෙළිදරව් කිරීමක් කළ යුතුය. |
| (ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 19<br>උක්ත ප්‍රමිතයේ 05 වන වගන්තිය ප්‍රකාරව ආයතනය සේවක ප්‍රතිලාභ ක්‍රම ක්‍රියාත්මක කර තිබූ අතර, ප්‍රමිතයේ 140 හා 141 වන වගන්ති ප්‍රකාරව 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයේ හෙළිදරව් කර නොතිබුණි. | 2019 වර්ෂයේදී හෙළිදරව් කිරීමට කටයුතු කරමි. | සේවක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණවත් පරිදි හෙළිදරව් කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රාජ්‍ය ප්‍රදානයන්ගෙන් මිලදී ගෙන තිබුණු රු.138,787,751 ක් වූ ජංගම නොවන වත්කම් වාර්ෂිකව ක්ෂය කර ඇතත්, ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණි. | 2019 ඔක්තෝබර් 06 දින පැවැත්වීමට නියමිත විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව ප්‍රතිපත්තියක් හඳුනාගෙන ඉදිරියේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ඇත. | ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කිරීම සඳහා ගිණුම් ප්‍රතිපත්තියක් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ශිල්ප සභාවේ පුහුණු මධ්‍යස්ථාන 112 වෙනුවෙන් වියදම් දැරීම සඳහා ලබා දී ඇති මුදලින් ඉතිරි වීම් ඇතුලුව එම මධ්‍යස්ථානවල අලෙවියෙන් ලැබූ ආදායම වූ එකතුව රු. 2,941,212 ක් සමාලෝචිත වර්ෂය අවසාන දිනට ගිණුම් ගත වී නොතිබුණි. එම මුදල අලෙවි මධ්‍යස්ථානයන්හි පැවති ඉතිරි කිරීමේ ගිණුම් වල ශේෂයන් ලෙස පැවතුණි. | අදාළ බැංකු වෙත ලිපි යවා ඇති අතර, එම ශේෂ සනාථන ලිපි ලැබුණු පසුව එම මුදල් ප්‍රධාන කාර්යාල ගිණුමකට මාරු කර පළාත් මට්ටමින් ගිණුම් ආරම්භ කර ඒ හරහා පුහුණු මධ්‍යස්ථාන ගණුදෙනු සිදු කරනු ලැබේ. | පිළිතුර පරිදි නිවැරදි කිරීම සුදුසු වේ. |
| (ආ) 2018 දෙසැම්බර් 31 දිනට ශිල්ප සභාව සතු පුහුණු මධ්‍යස්ථානවල ඇති ස්ථාවර වත්කම් හඳුනාගෙන තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ශිල්ප සභාව පුහුණු මධ්‍යස්ථාන වල වත්කම් භාවිතා කිරීම පමණක් සිදු කරනු ඇත. | පුහුණු මධ්‍යස්ථාන වල ඇති වත්කම් හඳුනාගෙන තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) 2017 වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේදී ගෙවීම් කරන ලද එකතු වටිනාකම රු.240,000 ක බදු කුළී වියදම, සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී උපචිත පදනමට ගිණුම් තැබීමට කටයුතු කරනු ඇත. | උපචිත පදනමට සභාව විසින් මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |
| (ඈ) සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශයෙන් ලැබියයුතු ප්‍රාග්ධන ප්‍රදාන සහ ප්‍රාග්ධන ප්‍රදානවලින් ගෙවියයුතු රු.5,828,720 ක් පුනරාවර්තන ප්‍රතිපාදන ලැබීම් සහ ගෙවීම් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ සටහන් කර තිබුණි. | මෙම රු.5,828,720 ප්‍රාග්ධනගත කිරීමට කටයුතු කර ඇත. | පුනරාවර්තන හා ප්‍රාග්ධන වැය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂය සඳහා පිත්තල අමුද්‍රව්‍ය මිලදී ගැනීමට රේඛීය අමාත්‍යාංශය මඟින් ලැබූ රු.5,266,069 ක වටිනාකම අමුද්‍රව්‍ය විකුණුම් ලෙස සටහන් කිරීම නිසා අමුද්‍රව්‍ය විකුණුම් ආදායම එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි. | මෙය 2019 වර්ෂයේ ගිණුම් වලින් නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | ප්‍රාග්ධන ප්‍රදාන නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | 2016 සහ 2017 වර්ෂයන් වලට අදාළව රු.1,085,853 ක් වූ විගණන ගාස්තු ඌන ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගැළපීම නිසා සමාලෝචිත වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | නිරීක්ෂණය නිවැරදිය | සමාලෝචිත වර්ෂයේ වියදම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | ශිල්ප සභාව විසින් සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකා වන ජීවී ආයතනයට විශේෂ ඇණවුම් ලෙස ලබාදීමට ශිල්පීන් 04 දෙනෙකු මඟින් එකතු වටිනාකම රු.478,748 ක භාණ්ඩ මිලදීගෙන තිබුණි. එම භාණ්ඩ සඳහා වන ජීවී ආයතනය මඟින් රු.165,435 ක මුදලක් පමණක් ලැබී තිබූ අතර, මිලදී ගත් භාණ්ඩ වෙනුවෙන් ශිල්පීන් වෙත එකතුව රු.147,500 ක් පමණක් ගෙවීම් කර තිබුණි. ඒ අනුව ශිල්පීන් වෙත ගෙවිය යුතු එකතු වටිනාකම රු.318,105 ක් ගෙවිය යුතු වියදම් ලෙසත්, ශිල්ප සභාවට ගැණුම්කරුගෙන් ලැබිය යුතු රු.313,313 ක වටිනාකම ලැබිය යුතු ආදායම් ලෙසත් ගිණුම්ගත කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි. | ඉතිරි මුදල් කඩිනමින් ලබාදෙන ලෙස වනජීවී ආයතනයට දැනුම්දී ඇත. | ගණුදෙනුවක් සම්පූර්ණයෙන් ගිණුම්ගත කළ යුතු අතර, මෙම මුදල් අයකර ශිල්පීන්ට ලබා දීමට ක්‍රියා කළ යුතුය. |

### 1.5.5 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූලා ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) අත්තිකාරම් ගිණුම | (18,984) | 318,531 | 337,515 | නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | පිළිතුර ප්‍රකාරව නිවැරදි කිරීමට ක්‍රියා කිරීම සුදුසු වේ. |
| (ආ) ස්ථාවර වත්කම් | 78,069,250 | 41,339,759 | 36,729,491 | වත්කම් තක්සේරු කිරීමක් සිදු කර නිවැරදි අගයන් පොත් වලට ගැනීමට කටයුතු කරමින් පවතී. | ස්ථාවර වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට ක්‍රියා කළ යුතුය. |

### 1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂ | 8,917,758 | ශේෂ සනාථන ලිපි | අදාළ ශේෂයන් සනාථ කර ගැනීමට ණයගැතියන් සඳහා ලිපි යවා ඇත. | ශේෂ සනාථන ලිපි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.8,917,758 ක ලැබිය යුතු ශේෂයන් ලෙස සටහන් කර තිබූ අතර, එම ශේෂයෙන් එකතුව රු.2,394,938 ක් වර්ෂ 03 ට වැඩි කාලයක සිට නිරවුල් නොවූ ශේෂයක් විය. මෙම හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වර්ෂ 03 ට වඩා පැරණි රු.2,347,522 ක් ලක්සල ආයතනයේ ලැබිය යුතු ශේෂයක් වන අතර, මේ සම්බන්ධව ලක්සල ආයතනය දැනුවත් කර ඇත. | හිඟ පැරණි ණය ශේෂ අය කර ගැනීමට ක්‍රියා කළ යුතුය. |

## 1.7 සම්බන්ධිත පාර්ශවයන් හා සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් නොකිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජාතික ශිල්ප සභාවේ සභාපතිනිය ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකාවක් ලෙස එම ආයතනයේ මූල්‍ය හා මෙහෙයුම් තීරණ වලට සම්බන්ධ වුවද ඒ පිලිබඳ මූල්‍ය ප්‍රකාශනයේ හෙළිදරව් කර නොතිබුණි. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කිරීමට කටයුතු කරනු ඇත. | පිලිතුර ප්‍රකාරව කටයුතු කිරීම සුදුසු වේ. |

## 1.8 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම රු. | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය | අත්තිකාරම් පියවීම නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩියෙන් ප්‍රමාද නොකළ යුතු වුවත්, 2000 සිට 2016 වර්ෂවල අවස්ථා 08 කදී ලබාදුන් එකතුව රු.258,651 ක අතුරු අග්‍රිම සමාලෝචිත වර්ෂ අවසාන දිනටද පියවීම් කර නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඉවත් කිරීමට කටයුතු කරනු ඇත. | මෙම පැරණි අත්තිකාරම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) 2015 ජුනි 01 දිනැති අංක පීඒඩී 2/2015 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ පළමු අර්ධ වර්ෂය තුළ සභාවේ නිලධාරීන් 08 දෙනෙකු සඳහා චක්‍රලේඛ සීමාව ඉක්මවා එකතුව රු.98,276 ක් දුරකථන වියදම් ලෙස වැඩිපුර ගෙවීම් කර තිබුණි. | වැඩිපුර ගෙවන ලද මුදල් ඉතා කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරනු ඇත. | වැඩිපුර ගෙවන ලද මුදල් අයකර ගැනීමට ක්‍රියා කළ යුතු අතර, චක්‍රලේඛ ප්‍රකාරව ගෙවිය යුතු සීමා තුළ දුරකථන වැය ගෙවීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) 2003 ඔක්තෝබර් 28 දිනැති අංක පීඒඩී 17 පොදු ව්‍යාපාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 04 කදී ශිල්ප සභාවේ නිලධාරීන්, චක්‍රලේඛය ප්‍රකාරව පූර්ව අවසර ලබා ගැනීමකින් තොරව විදේශගත වීම සඳහා එකතුව රු.2,128,799 ක් ගෙවීම් කර තිබුණි. | මේ වන විට අවසර ලබා ගැනීමටත්, අදාළ වාර්තා ඉදිරිපත් කිරීමටත් කටයුතු කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියා කළ යුතු අතර, ඒ අනුව විදේශ සංචාරයට පූර්ව අවසර ලබා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.7,068,565 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.5,336,897 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,731,668 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මුළු ආදායම රු.27,046,881 කින් වැඩිවී තිබියදී ඊට ප්‍රතිරූපීව මුළු වියදම රු.28,778,549 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අම්පාර උහන මැටි නිෂ්පාදන ගම්මානයේ ප්‍රතිලාභීන් සඳහා බෙදා දීමට සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගත් එකතු වටිනාකම රු.1,272,333 ක් වටිනා අත් යන්ත්‍ර, රෙදි වියන මැෂින්, මහන මැෂින්, විදුලි ස්ත්‍රික්ක,සෙවිලි තහඩු ඇතුළුව භාණ්ඩ වර්ග 10 ක ද්‍රව්‍ය හා උපකරණ 2019 මැයි 20 දින දක්වා ප්‍රතිලාභීන් වෙත බෙදාහැර නොතිබුණි. | ගම්මානයේ පොදු පහසුකම් මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම අවසන් වූ වහාම ගම්මානය විවෘත කර එහි ශිල්පීන් වෙත උපකරණ ලබා දීමට කටයුතු කරනු ඇත. | ශිල්පීන් සඳහා බෙදා හැරීමට මිලදී ගත් ද්‍රව්‍ය හා උපකරණ එම ශිල්පීන් වෙත භාර දීමට ක්‍රියා කළ යුතු වේ. |
| (ආ) ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ අංක 4/10/36563 සහ 2013 නොවැම්බර් 28 දින දරන ලිපියේ සඳහන් කොන්දේසි වලට අනුකූලව ශිල්ප සභාවේ කළමනාකරණය ක්‍රියා නොකිරීම නිසා 2019 මැයි 25 දින වන විටත්, හම්බන්තොට කාවන්තිස්සපුර හස්ත කර්මාන්ත නිෂ්පාදන හා අලෙවි ගම්මානයේ ඉදිකිරීම් වල ඉඩම සඳහා නීත්‍යානුකූල බදු ගිවිසුමකට එළඹ නොතිබූ අතර, 2018 දෙසැම්බර් 31 දිනට එකතු වටිනාකම රු.8,338,797 ක් වැය කර විවිධ ඉදිකිරීම් ශිල්ප සභාව විසින් සිදු කර තිබුණි. එසේම වාර්ෂිකව බදු මුදල් ලෙස රු.240,000 ක් බැගින් ශිල්ප සභාව විසින් ප්‍රාදේශිය ලේකම් වෙත ගෙවීම් කර තිබුණි. | මෙම ඉඩම පවරා ගැනීම සඳහා එකවර ගෙවිය යුතු මුදල වන රු.720,000 ක මුදල ගෙවීමෙන් නිදහස් කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇති අතර, එම ඉල්ලීම ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමු කර ඇත. ඒ සඳහා උපදෙස් ලැබී නොමැති අතර, එම මුදල ගෙවීමෙන් පසුව බදුකරය අත්සන් කළ හැකි බව ප්‍රාදේශීය ලේකම් දැනුම්දී ඇත.ඒ අනුව මේ පිළිබඳව ඉඩම් කොමසාරිස් සමඟ සාකච්ඡා කරමින් පවතී. | ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් පරිදි ප්‍රාදේශීය ලේකම් සමඟ බදු ගිවිසුමකට එළඹීමට ක්‍රියා කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) ශිල්ප සභාවේ රාජ්‍ය බැංකු ජංගම ගිණුම් 02 කට අදාළව එකතු වටිනාකම රු.55,598 ක හඳුනා නොගත් තැන්පතු මුදල් හඳුනාගෙන නිරවුල් කිරීමකින් තොරව බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර තිබුණි. | හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී. | විගණන හා කළමනාකරණ කමිටු උපදෙස් ප්‍රකාරව සොයා බලා මෙම ගණුදෙනු හඳුනාගෙන නිරවුල් කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (ඈ) ශිල්ප සභාවේ එක් බැංකු ජංගම ගිණුමකට අදාළ එකතු වටිනාකම රු.47,927 ක් 2012 වර්ෂයේ සිට හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු නොකර බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර තිබුණි. | මෙම හඳුනා නොගත් හර වටිනාකම් විගණන හා කළමනාකරණ කමිටු උපදෙස් ප්‍රකාරව තව දුරටත් හඳුනා ගැනීමට කටයුතු කරමින් පවතී. | විගණන කමිටු උපදෙස් ප්‍රකාරව හඳුනාගෙන නිරවුල් කළ යුතුය. |
| (ඉ) සමාලෝචිත වර්ෂය තුළ ගෙවීම් වවුචර් පත්‍ර 09 ක් භාවිතා කර එකතු වටිනාකම රු.339,125 ක් ගෙවා ඩිනාලි ග්‍රැෆික් (Dinali Graphics) ආයතනය මඟින් විවිධ මුද්‍රණ කටයුතු සිදු කර ගෙන තිබුණි. මෙම ප්‍රසම්පාදන කාර්යයට අදාළව ක්‍රමානුකූලව හා යෝග්‍ය පරිදි පවත්වාගෙන ගිය ලිපිගොණු හා වාර්තා විගණනයට කළමනාකරණය විසින් ඉදිරිපත් නොකරන ලදී. | මේ පිළිබඳ මූලික විමර්ශන ආරම්භ කර ඇති අතර, එම ආයතනය මඟින් මුද්‍රණ කටයුතු සිදු කිරීමට තාවකාලිකව නවතා ඇත. | ප්‍රසම්පාදන කාර්යයන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව සිදු කළ යුතු අතර, ඒ පිළිබඳ වාර්තා ප්‍රමාණවත් පරිදි පවත්වාගෙන යා යුතුය. සිදු කළ ගෙවීම් පිළිබඳ සොයා බලා මූලික විමර්ශන තීරණ මත පදනම්ව ඉදිරි ක්‍රියා මාර්ග ගත යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුළ ගුරු ශිල්පී පුහුණු වැඩසටහන යටතේ ශිල්පීන් 750 කට ඇස්තමේන්තුගත පිරිවැය රු.900,000 ක් වැය කර උපකරණ ලබාදීමට ක්‍රියාකාරී සැලැස්ම අනුව සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ රු.464,000 ක් වැය කර ශිල්පීන් 244 කට උපකරණ ලබා දීම නිසා මෙම අරමුණ ලඟා කර ගැනීමේ මූල්‍ය ප්‍රගතිය සියයට 52 ක්ද, භෞතික ප්‍රගතිය සියයට 33 ක්ද විය. | පෙර වසර වල ගුරු ශිල්පී පන්ති සඳහා ලබා දී ඇති උපකරණ වලින් කොටසක් මෙම වර්ෂය තුළදීද උපයෝජනය කර ඇති හෙයින් අත්‍යාවශ්‍ය පන්ති සඳහා පමණක් නව උපකරණ ලබා දී ඇත. | පුහුණු වැඩසටහන් සඳහා ප්‍රමාණවත් උපකරණ අවශ්‍යතා හඳුනාගෙන ඒ පිළිබඳව සැලසුම්වල සටහන් කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය තුළ පුහුණු මධ්‍යස්ථාන වලින් පුහුණුව ලැබූ පුහුණුලාභීන් 300 කට ඇස්තමේන්තුගත පිරිවැය රු.1,000,000 කට යන්ත්‍ර සූත්‍ර, උපකරණ, මෙවලම් හා අමුද්‍රව්‍ය සැපයීමට සැලසුම් කර තිබුණද, සත්‍ය ලෙස රු.521,000 ක් වැය කර ප්‍රතිලාභීන් 104 කට පමණක් උපකරණ හා අමුද්‍රව්‍ය ලබා දීම නිසා එහි මූල්‍ය ප්‍රගතිය සියයට 52 ක්ද, භෞතික ප්‍රගතිය සියයට 35 ක්ද විය. | ශිල්පීන් සත්‍ය ලෙසම කෙත්ත්‍රයේ සිටිද යන්න සොයා බලා තහවුරු කර ගැනීමෙන් පසුව උපකරණ ලබාදීම සිදු කරන බැවින් ශිල්පීන් 104 දෙනෙක් සඳහා පමණක් උපකරණ ලබා දී ඇත. | ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේදී අවශ්‍ය උපකරණ අවශ්‍යතාවයන් නිරවද්‍යව හඳුනාගෙන සැලසුම් වලට ඇතුළත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව දේශීය වෙළඳපළ ප්‍රදර්ශන පැවැත්වීම මඟින් රු.10,000,000, ක අලෙවි වටිනාකමක් සහ විදේශීය වෙළඳපල ප්‍රවර්ධනය හා පුහුණු වැඩසටහන් මඟින් රු.4,000,000 ක අලෙවි ඉලක්කයක් අපේක්ෂා කර තිබුණද, කාර්ය සාධන වාර්තාවේ ඒ සඳහා ලබාගත් ප්‍රගතිය ඇතුළත් නොකිරීම නිසා එම කාර්යයන් වල භෞතික ප්‍රගතිය පරීක්ෂා කිරීමට නොහැකි විය. | දේශීය හා විදේශීය අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් මඟින් අපේක්ෂා කරන අලෙවි ආදායම කාර්ය සාධන වාර්තාව තුළ අන්තර්ගත කිරීමට කටයුතු කරමි. | පිළිතුර ප්‍රකාරව කටයුතු කිරීම සුදුසු වේ. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) හම්බන්තොට කාවන්තිස්සපුර ගම්මානයේ වාහන අංගනය ඉදි කිරීම සඳහා රු.2,782,773 ක් වූ කොන්ත්‍රාත්තුව 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව මිල ගණන් කැඳවීමකින් තොරව අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණය මත මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පිරි නමා තිබුණි. එසේම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.6 වගන්තිය ප්‍රකාරව රැඳවුම් මුදල් අඩු කිරීමකින් තොරව සම්පූර්ණ මුදලම මාර්ග සංවර්ධන අධිකාරියට නිදහස් කර තිබුණි. අධිකාරිය විසින් එම කාර්යය "රත්න කන්ස්ට්‍රක්ෂන්ස්" ආයතනය වෙත උප කොන්ත්‍රාත්තුවක් ලබා දී ඉටු කර තිබුණි. | රජයේ ආයතනයක් බැවින් එම ආයතනය මඟින් මෙම කොන්ත්‍රාත් සිදු කර ගැනීමට කටයුතු කර ඇත. | ප්‍රසම්පාදන කාර්යයන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව ඉටු කළ යුතුය. |
| (ආ) උක්ත ගම්මානයේ භූමි අලංකරණ කාර්යය ද ඉටු කිරීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පදනම් කරගෙන මාර්ග සංවර්ධන අධිකාරිය වෙත රු.2,666,508 ක් ගෙවා තිබුණි. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් "රත්න කන්ස්ට්‍රක්ෂන්ස්" ආයතනය වෙත උප කොන්ත්‍රාත්තුවක් ලබා දී ඉටු කර තිබුණි. | ඉදිරියේදී මිල කැඳවීම් ලබාගෙන කටයුතු කරනු ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම හා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම සිදු කළ යුතුය. |
| (ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 වගන්තිය ප්‍රකාරව භාණ්ඩ හෝ සේවා ලබා ගැනීමේදී විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹීමට ක්‍රියා කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ හම්බන්තොට කාවන්තිස්සපුර හස්ත කර්මාන්ත ගම්මානයේ සහ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන යටතේ එකතු වටිනාකම රු.3,333,042 ක භාණ්ඩ හෝ සේවා ලබා ගැනීමේදී අදාළ කොන්ත්‍රාත්කරුවන් සමඟ ලිඛිත ගිවිසුමකට එළඹීමට සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 වගන්තිය ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී කාර්ය සාධන සුරක්ෂණ ලබා ගැනීමට කටයුතු කරනු ඇත. | ප්‍රසම්පාදන කාර්යයන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව ඉටු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය තුළ නව හස්ත කර්මාන්ත දිස්ත්‍රික් ශිල්ප සභා 25 ක් පිහිටුවීමටත්, ශිල්පීය සමිති 50 ක් පිහිටුවීමට හා යාවත්කාලීන කිරීමටත් සැලසුම් කර තිබුණද, පිළිවෙලින් දිස්ත්‍රික් ශිල්ප සභා 06 ක් පිහිටුවීම සහ සමිති 15 ක් පමණක් පිහිටුවීම නිසා එහි භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 24 ක් සහ සියයට 30 ක්ව පැවතුණි. | 2019 පළමු කාර්තුව තුළ දිස්ත්‍රික් 25 ආවරණය වන පරිදි දිස්ත්‍රික් ශිල්ප සභා පිහිටවීමට පියවර ගෙන ඇත. | ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් කළ ඉලක්ක ලඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 4.2 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ ශිල්ප සභාවේ අභ්‍යන්තර විගණන අංශය විසින් නිකුත් කර තිබූ විගණන විමසුම් 22 කින් විමසුම් 15 කට පිළිතුරු දීමට කටයුතු කර නොතිබීම නිසා අභ්‍යන්තර විගණන අංශයේ ක්‍රියාකාරීත්වය කළමනාකරණය විසින් ඵලදායීව හා කාර්යක්ෂම ලෙස ආයතනයේ පාලන කටයුතු සඳහා භාවිතා කර නොතිබුණි. | පිළිතුරු ලබා දෙන ලෙස අදාළ අංශ ප්‍රධානීන් වෙත සිහිකැඳවීම් ලිපි යොමු කර ඇත. | අභ්‍යන්තර විගණන අංශයේ විමසුම් සඳහා පිළිතුරු ලබා ගැනීමටත් ඒවායේ සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කර නිවැරදි කිරීමටත් ක්‍රියා කළ යුතුය. |